2022 වර්ෂයේ දී සිසු ඉගෙනුම් අවස්ථා අහිමිවීම ආවරණය සඳහා වන විශේෂ විෂය නිර්දේශය

8 ශ්‍රේණිය

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

තොරතුරු තාක්ෂණ දෙපාතර්මේන්තුව

විද්‍යා හා තාක්ෂණ පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

www.nie.lk

# හැඳින්වීම

රට තුළ පැන නැගී තිබූ උග්‍ර ආර්ථික අර්බුදය හේතුවෙන් ප්‍රවාහන දුෂ්කරතා සහ වෙනත් විවිධ හේතූන් මූලික කර ගනිමින් 2022 වර්ෂය ආරම්භයේ සිට ම වරින් වර පාසල් වසා තැබීම සිදු විය. පාසල් වසා තබන ලද කාල සීමාව තුළ දී ඉගෙනීමේ ක්‍රමය මාර්ගගත ක්‍රමය වෙත මාරු වුව ද මේ සඳහා පහසුකම් සපයා ගත හැකි දරු පිරිස ඉතා සීමිත සංඛ්‍යාවකි. ශ්‍රී ලංකාවේ දුරස්ථ අධ්‍යාපනය ලබා දීමේ ප්‍රවේශය සහ ගුණාත්මකභාවය අතින් බොහෝ අඩුපාඩු පෙන්නුම් කර ඇති අතර මෙම ක්‍රමය හේතුවෙන් ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය ශක්තිමත් වී ඇති අතර සිසුන්ගේ පාසල් කාලය අහිමි වීම තුළ පාසල් ප්‍රජාවගෙන් සිසුන් ඈත්වීම ද යහපත් ප්‍රවනතාවක් නොවන බව දැකිය හැකි ය.

පවතින අභියෝගතා මධ්‍යයේ වුව ද යම්තාක් දුරකට හෝ විධිමත් ලෙස පාසල් පැවැත්වීම අනාගත් දරු පරපුරේ අභිවෘද්ධියට හේතු සාධක වනු ඇත. එම අරමුණින් යුතුව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පළාත් මට්ටමින් රැස් කර ගෙන ඇති තොරතුරු මත සමස්ථයක් ලෙස පළමු වාරයට අදාළ ව පාසල් පවත් වන ලද දින ගණන දින 30ක් ලෙස පෙන්වා දී ඇත.

මෙම තීරණයට අනුව අට ශ්‍රේණිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පළමුවන වාරයේ ඉතිරිව ඇති පාඩම් ආවරණය කිරීම සඳහා කාලච්ඡේද 4 ක් ද දෙවන හා තුන්වන වාරයේ පාඩම් ආවරණය කිරීම සඳහා කාලච්ඡේද 7ක් බැගින් ද යොජනා කර ඇත. ඒ අනුව ජාතික අධ්‍යාපන ආයතනයේ නිළධාරින්, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිළධාරින්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිළධාරින් සහ පළාත් සම්බන්ධීකරණ නිළධාරින්ගේ සහභාගීත්වයෙන් යුතු ව මෙම 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා වන ප්‍රතිසාධන සැලැස්ම සකස් කර ඇත.

දැනට පවතින අට ශ්‍රේණිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂය නිර්දේශය සැලකීමේ දී පළමුවන වාරය සඳහා පාඩම් දෙකක් ඇතුළත් කර ඇති අතර ඒ සඳහා වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව 4කි. දෙවන වාරය සඳහා පාඩම් දෙකක් ඇතුළත් කර ඇති අතර එම පාඩම් ආවරණය සඳහා වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව 7කි. තුන්වන වාරයට පාඩම් දෙකක් ඇතුළත් කර ඇති අතර එම පාඩම් ආවරණය සඳහා වෙන් කර ඇති කාලච්ඡේද සංඛ්‍යාව 7කි.

පළමුවන වාරය සඳහා කාලච්ඡේද 4ක් සහ දෙවන හා තුන්වන වාර සඳහා කාලච්ඡේද 7ක් බැගින් සමානව යෝජනා කර ඇති නිසා මූලික වශයෙන් දැනට පවතින විෂය නිර්දේශයේ පහත සංශෝධන සිදු කරමින් අත්‍යාවශ්‍ය යැයි සළකන විෂය අන්තර්ගතය ඇතුළත් කරමින් මෙම ප්‍රතිසාධන සැලැස්ම සකස් කර ඇත.

- පළමුවන වාරයේ 1.0 නිපුණතා මට්ටමේ සිට 2.1 නිපුණතා මට්ටම දක්වා පාසල පවත්වන ලද දින 21 තුළ දී නියමිත පරිදි ආවරණය කර ඇති සේ සළකා පළමුවන වාරයේ ඉතිරි ව ඇති නිපුණතා මට්ටම 2.1, 2.2, 3.0 සහ 3.1 නිපුණතාවය යෝජිත කාලච්ඡේද 4ක් තුළ අවසන් කිරීමට යෝජනා කර ඇත.

- දෙවන වාරයේ 4.1 නිපුණතා මට්ටම ඉවත් කර ඇත. එය 6 ශ්‍රේණියේ සහ 7 ශ්‍රේණියේ විෂය නිර්දේශයෙන් අවරණය වී ඇත.

මීට අමතර ව ඉගැන්වීමට යෝජනා කර ඇති සියලු ම පාඩම් හි සංකල්ප සාකච්ඡා කිරීම, එක් එක් වාරයට යෝජනා කර ඇති කාලච්ඡේද ගණන තුළ ආවරණය කිරීමට යෝජනා කර ඇත. එක් එක් පාඩමට අදාළ ව කාලච්ඡේද වෙන් කර ගත යුතු ආකාරය පළමුවන, දෙවන හා තුන්වන වාරවලට අදාළ ව වෙන් වෙන් වශයෙන් විෂය නිර්දේශය යටතේ ඉදිරිපත් කර ඇත. වෙන් කර ඇති කාලච්ඡේද ගණන පාසලේ සිසුන්ගේ ස්වභාවය මත හා එක් එක් වාරයට යෝජනා කර ඇති කාලච්ඡේද ගණනට යටත්ව සංශෝධනය කර ගැනීමට මෙන් ම යෝජිත කාලච්ඡේද ගණන අවසන් වීමට ප්‍රථම පළමුවන හා දෙවන වාරයට යෝජනා කර ඇති පාඩම් ඉගැන්වීම අවසන් කරයි නම් අත්‍යාවශ්‍ය නොවේ යැයි සළකා ඉවත් කර ඇති පාඩම්, සිසු ස්වයං අධ්‍යයනයට යොමු කිරීමට ද දෙවන හා තුන්වන වාරයට අදාළ පාඩම් පිළිවෙලින් ඉගැන්වීම ආරම්භ කිරීමට ද ගුරුවරයාට නිදහස ඇත.

ගුරුවරයාට උපදෙස්:

- 8 ශ්‍රේණියේ සිසුන් විසින් විෂය නිර්දේශය සම්පූර්ණ කිරීම සඳහා අත්‍යවශ්‍ය වන විෂය අන්තර්ගතය පහත වගුවේ දැක්වේ.
- ගුරුවරයාට තම අභිමතය පරිදි ඕනෑම අත්‍යවශ්‍ය අන්තගර්තයක් (පහත වගුවේ දී ඇති අන්තගර්තය හැර) ඇතුළත් කිරීමට නිදහස ඇත.
- ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ක්‍රියාවලියේදී මිශ්‍ර ඉගෙනුම් ක්‍රමය අනුගමනය කරන ලෙස ගුරුවරුන්ට උපදෙස් දෙනු ලැබේ.
- 'ගුරුගෙදර' සහ 'E -තක්සලාව' යන ඉගෙනුම් එළඹුම් භාවිතයෙන් තම විෂය දැනුම දියුණුකර ගැනීමට සිසුන් මෙහෙයවන්න.
- 'ගුරුගෙදර' සහ 'E -තක්සලාව' භාවිතා කිරීමට අපහසුතා පවතින සිසුන් සඳහා ප්‍රමාණවත් තොරතුරු තාක්ෂණික යටිතල පහසුකම් සපයන්න.

## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (Recovery Plan for Learning Loss - 2022)

## 8 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| 08 ශ්‍රේණිය පළමු වන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | | |
| 2. මෙහෙයුම් පද්ධතිය සමග කාර්යක්ෂමව හා ඵලදායීව පරිගණක භාවිත කරයි. | 2.1. සැකසුම් කිරීම සහ වින්‍යාසකරණය සඳහා මෙහෙයුම් පද්ධතිය භාවිතා කරයි | • සැකසුම් කිරීම: දිනය, වේලාව, මුදල්, සංඛ්‍යා ආකෘති සැකසුම් කරයි<br>• ගොනු ගුණාංග සකසයි: පඨනමාත්‍ර සැඟවුණු පිහිටීම ප්‍රමාණය සැකසුම් කරයි<br>• දිගුව උපයෝගී කරගෙන ගොනු සොයයි | • ප්‍රාදේශීය සැකසීම්: දිනය, වේලාව, මුදල්, සංඛ්‍යා ආකෘති (Regional settings: Date, Time, Currency, Number format)<br>• ගොනු ගුණාංග (File properties)<br>• ගොනු සෙවීම (File Search) | පිටු අංක 15හි ඇති ඒකකය 2.1 බලන්න | පිටු අංක 11 සිට 14 දක්වා ඇති පාඩම බලන්න | 01 |
| | 2.2. පරිගණක වල මූලික දෝෂ නිරාකරණය සහ නඩත්තු ක්‍රියා පටිපාටි ගවේෂණය කරයි (දෘඩාංග සහ මෘදුකාංග) | • දෘඩාංග දෝෂ ගවේෂණය කර අදාළ දෝෂ විසඳීම සිදු කරයි<br>• මෘදුකාංග දෝෂ ගවේෂණය කර අදාළ දෝෂ විසඳීම සිදු කරයි | • සරල පරිගණක දෝෂ නිරාකරණය<br>• දෘඩාංග ගැටළු - (Hardware issues -(keyboard, mouse, power cable, network cable, VGA cable)<br>• ශබ්ද ප්‍රතිදාන ගැටළු-(Sound output issues (speaker connectivity, check the volume) | පිටු අංක 22හි ඇති ඒකකය 2.2 බලන්න | පිටු අංක 15 සිට 33 දක්වා ඇති පාඩම බලන්න | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | | • අදාළ පරිගණක මෘදුකාංග ගැටළු දෝශ නිරාකරණය කිරීම සහ විසඳීම<br>• දූෂිත මෘදුකාංග (Corrupted software )<br>• හිස් ඩෙස්ක්ටොප් (Blank Desktop) | | | |
| 3. එදිනෙදා ක්‍රියාකාරකම් සඳහා වදන් සැකසුම් මෘදුකාංග භාවිත කරයි. | 3.1. ලේඛනයක් සකස්කිරීමේදී වදන් සැකසුම් මෘදුකාංගයේ මූලික ක්රියාකාරකම් භාවිතා කරයි | • වදන් සැකසුම් මෘදුකාංගය භාවිතයෙන් හැඩසව් ගන්වන ලද ලේඛනයක් පිළියෙළ කරයි. | • ලේඛනයක් පිළියෙළ කිරීම, විවෘත කිරීම, ගබඩා කිරීම සහ වැසීම<br>• පාඨ හැඩසව් කිරීම | පිටු අංක 26 හි ඇති ඒකකය 3.1 බලන්න | පිටු අංක 34 සිට 36 දක්වා ඇති පාඩම බලන්න | 01 |
| | | | | | සමස්ත එකතුව | 04 |

**2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම (Recovery Plan for Learning Loss - 2022)**

**8 ශ්‍රේණිය**

| **නිපුණතාව** | **නිපුණතා මට්ටම** | **ඉගෙනුම් පල** | **විෂය අන්තර්ගතය** | **ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය** | **පෙළ පොතේ පාඩමේ අංකය සහ නම** | **කාලච්ඡේද ගණන** |
|---|---|---|---|---|---|---|
| 08 ශ්‍රේණිය දෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | | |
| 3. එදිනෙදා ක්‍රියාකාරකම් සඳහා වදන් සැකසුම් මෘදුකාංග භාවිත කරයි. | 3.1.ලේඛනයක් සකස් කිරීමේ දී වදන් සැකසුම් මෘදුකාංගන්ගේ මූලික ක්‍රියාකාරකම් භාවිත කරයි. | • වදන් සැකසුම් මෘදුකාංගය භාවිතයෙන් හැඩසව් ගන්වන ලද ලේඛනයක් පිළියෙල කරයි. | • පාඨ හැඩසව් කිරීම<br>• පාඨ, චිත්‍රක, හැඩ, clip art, word art,… ආදි ගොනු/ වස්තු ඇතුළත් කිරීම<br>• වගුවක් ඇතුළත් කිරීම<br>• අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ දෝෂ පරීක්ෂා කිරීම<br>• ලැයිස්තු | පිටු අංක 26හි ඇති ඒකකය 3.1 බලන්න | පිටු අංක 36 සිට 38 දක්වා ඇති පාඩම බලන්න | 6 |
| 4.අනුක්‍රමය, තේරීම, පුනකර්රණය සහිත සරල ගැටලු විසඳීමට ගැලීම් සටහන් භාවිත කරයි. (Scratch භාවිතය) | 4.2 ක්‍රමලේඛ සංවර්ධනය සඳහා පාලන ව්‍යුහයන් භාවිත කරයි. | • එදිනෙදා ජීවිතයේ සරල ගැටලු විසඳීමට පාලන ව්‍යුහයන් යොදා ගනියි. | • සරල ඇල්ගොරිතම සහ තේරීම් පාලන ව්‍යුහයන් හැඳින්වීම<br>•<br>• පරිගණක භාෂාවන්ගේ (අතුරු මුහුණත් භාවිතය) දෘශ්‍ය ආධාරක භාවිතයෙන් සරල වැඩසටහනක් (අනුක්‍රමය සහ තේරීම) පිළියෙළ කිරීම | පිටු අංක 44හි ඇති ඒකකය 4.2 බලන්න | පිටු අංක 41 සිට 54 දක්වා ඇති පාඩම බලන්න | 1 |
| | | | | | සමස්ත එකතුව | 7 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| 08 ශ්‍රේණිය තෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | | |
| 5.ක්‍රමලේඛන තකර් ක්‍රියාත්මක කිරීමට, භෞතික ආගණනය සඳහා මෘදුකාංග පැකේජ භාවිත කරයි. | 5.1. භෞතික ආගණනය ක්‍රියාත්මක කිරීම සඳහා සරල දෘඩාංග උපක්‍රම භාවිත කරයි. | • තාර්කික මට්ටම් (ඔව්/ නැත) භාවිතයෙන් බාහිර පරිපථ ක්‍රියාත්මක කරවීමට ක්‍රමලේඛ ලියයි.<br>• භෞතික උපක්‍රම සඳහා ක්‍රමලේඛ ක්‍රියාත්මක කරයි. උදාහරණ: අගයයන් ලබා දෙමින් LED බල්බ දැල්වීම/ නිවීම සිදු කරයි. | • භෞතික ආගණන සංරචක<br>• පාලන ව්‍යූහ භාවිතය: පුනර්කරණය (පුනරුක්තිය)<br>• LED බල්බ දැල්වීම හා නිවීම<br>• සරල පරිගණක ක්‍රමලේඛ භාවිතයෙන් LED බල්බ දල්වන රටා සැකසීම | පිටු අංක 47හි ඇති ඒකකය 5.1 බලන්න | පිටු අංක 55 සිට 62 දක්වා ඇති පාඩම බලන්න | 5 |
| 6.අන්තජර්ාලය භාවිතයෙන් අධ්‍යාපන තොරතුරු ගවේෂණය කරයි. | 6.2 උසස් ලක්ෂණ සහිත සරල වෙබ් අඩවි නිමර්ාණය කරයි. | • පිරිවිතර අනුව වෙබ් අඩවි පිරිසැලසුම් කරයි.<br>• පිරිසැලසුම අනුව වෙබ් අඩවි නිමර්ාණය කරයි. | • උපුලන, මූලිකාංග, ගුණ, පාඨ හැඩසව් ගැන්වීම යනාදිය<br>• අධිසම්බන්ධකවල උසස් ගුණාංග | පිටු අංක 62හි ඇති ඒකකය 6.2 බලන්න | පිටු අංක 66 සිට 70 දක්වා ඇති පාඩම බලන්න | 2 |
| | | | | | සමස්ත එකතුව | 7 |